මගේ අංකය :- JSC/SEC/CIR/2023

සියලුම අධිකරණ නිලධාරීන් වෙත,

<u>ගිනි අවි සහ තහනම් අවි ආයුධ මුහුදේ ගිල්වා විනාශ කිරීම සම්බන්ධව</u>

ශීර්ෂගත කරුණට අදාලව ආරක්ෂක අමාත්‍යාංශයේ හමුදා සම්බන්ධතා නිලධාරී මේජර් ජෙනරාල් ඩී.පී. වෙලගෙදර ආර්එස්පී යූඑස්පී මහතා විසින් යොමු කර ඇති ලිපි (ඇමුණුම A, B සහ C) පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපි අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකොට අවශ්‍ය කටයුතු සඳහා ඔබගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

2023 දෙසැම්බර් මස 21 වන දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையக கட்டிடம், ஸ்ரீ ஜயவர்த்தனபுர, கோட்டே, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. Website : www.defence.lk

තැ. පෙ. / த. பெட்டி / P.O. Box 572 | දුරකථන / தொலைபேசி / Telephone 2430860-9, 2430870-8 | ලේකම් / செயலாளர் / Secretary: දුර./தொ./Tel. : 011 2381154, ෆැක්ස්./தொ./Fax.: 011 2541529, වි. තැපෑල/மி.அ./Email : secdefence@defence.lk

මගේ අංකය / எனது இல / My No: එම්ඩීඑස්/එම්එල්ඕ/ජේඩීඑස්/02/02 (10)

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2023 අගෝස්තු 15 දින

A

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

<u>ගිනි අවි සහ තහනම් අවි ආයුධ මුහුදේ ගිල්වා විනාශ කිරීම</u>

යොමුව: අංක එන්එච්කිව්/ඔප්ස්/එස්ටීසී/පීඑන්/එස්ඩී/014/2023 හා 2023.08.12 දාතමින් යුතුව නාවික හමුදා මූලස්ථානය වෙතින් මෙම අමාත්‍යාංශය වෙත යොමු කර ඇති ලිපිය (පිටපතක් අමුණා ඇත).

1. අධිකරණයන්හි නඩු කටයුතු අවසන් වූ ගිනි අවි සහ තහනම් අවි ආයුධ මුහුදේ ගිල්වා විනාශ කිරීම සම්බන්ධයෙන් යොමුගත ලිපිය මගින් පෙන්වා දී ඇති අපහසුතාවයන් මගහරවා ගැනීම සඳහා එම ලිපියේ ඡේද අංක 2 මගින් යෝජිත ක්‍රමවේදය සම්බන්ධයෙන් ඊට අදාල වගකිව යුතු සියළු බලධාරීන් දැනුවත් කිරීමට අවැසි ඉදිරි කටයුතු සිදු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

2. එසේ වුවද, ආරක්ෂිත හෝ නීතිමය කටයුතු හේතුකොට ගෙන හදිසි අවශ්‍යතාවයන් මත ගිනි අවි හෝ තහනම් අවි ආයුධ මුහුදේ ගිල්වා විනාශ කිරීමට අවශ්‍ය වුවහොත්, ඒ හා සබැඳි ඉදිරි කටයුතු නාවික හමුදා මූලස්ථානය සමඟ සම්බන්ධීකරණය වී සිදු කර ගන්නා මෙන් වැඩිදුරටත් දන්වා සිටිනු ලැබේ.

3. සුදුසු කටයුතු සඳහා ඉදිරිපත් කෙරේ.

ඩී පී වෙලගෙදර ආර්එස්පී යූඑස්පී
බ්‍රිගේඩියර්
හමුදා සම්බන්ධතා නිලධාරී
ආරක්ෂක ලේකම් වෙනුවට

පිටපත්:

ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය
යුධ හමුදාධිපති
නාවික හමුදාධිපති
ගුවන් හමුදාධිපති

RECEIVED
15 AUG 2023
Secretary's Office
Ministry of Justice,
Prison Affairs and
Constitutional Reforms

නීති අංශය
16 AUG 2023
(13)

B

# ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය
කොළඹ
இலங்கை கடற்படைத் தலைமை அலுவலகம்
கொழும்பு
**SRI LANKA NAVY HEADQUARTERS**
**COLOMBO**

ඔබේ අංකය / உமது இல. / Your No:

මගේ අංකය / எனது இல. / My No: [illegible]/014/2023

තැපැල් පෙට්ටිය / தபால் பெட்டி / P.O Box: 593
දුරකථන / தொலைபேசி / Telephone: +94117190000, +94117192100
ෆැක්ස් / தொலைநகல் / Fax: +94112441454
දිනය / திகதி: 2023 අගෝස්තු 12

අමාත්‍යාංශය
14 AUG 2023
සම්බන්ධතා නිලධාරී කාර්යාලය

හමුදා සම්බන්ධතා නිලධාරීගේ අවධානය සඳහා

ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

## ගිනි අවි, තහනම් අවි ආයුධ මුහුදේ ගිල්වා විනාශ කිරීම සම්බන්ධව

1. ශ්‍රී ලංකාව ආවරණය වන පරිදි සෑම දිස්ත්‍රික්කයකම පිහිටා ඇති අධිකරණයන්හි නඩු කටයුතු අවසන්වූ පසු ගිනි අවි, තහනම් අවි ආයුධ මුහුදේ ගිල්වා විනාශ කිරීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නිර්දේශයට යටත්ව නාවික හමුදාව විසින් මුහුදු ප්‍රවාහන පහසුකම් ලබාදීම සිදුකරනු ලබයි. කරුණු එසේ වුවද, අධිකරණ මගින් ඉල්ලුම් කරනු ලබන දිනයන්හිදී මුහුදු ප්‍රවාහන පහසුකම් ලබාදීමේදී පහත සඳහන් ප්‍රායෝගික අපහසුතාවලට නාවික හමුදාවට මුහුණදීමට සිදුවන බව නිරීක්ෂණය වේ.

අ. අධිකරණ වෙතින් අදාල කටයුතු සඳහා දින නියම කර ලිපි ඉදිරිපත් කර තිබුණද, ඒ ඒ නාවික ප්‍රදේශයන් සඳහා අනුයුක්ත කර ඇති සීමිත නෞකා සහ යාත්‍රාවල මෙහෙයුම් අවශ්‍යතාවයන් හේතුවෙන් නෞකා සහ යාත්‍රා යෙදවීමට අපහසු වීම.

ආ. මේ වන විට බාහිර ආයතනයන් වෙත නාවික හමුදා සේවාවන් ලබාදීමේදී මුදල් ගෙවීමේ සඳහාම මිල පමණක් සිදු කිරීමට ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් උපදෙස් ලබා දී තිබුණද, මෙම කටයුත්ත නාවික හමුදාවේ වගකීමක් ලෙස සලකා අධිකරණ නියෝගයන්ට අනුව සිදුකරනු ලබයි. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නිර්දේශය පරිදි ගිනි අවි, තහනම් අවි ආයුධ මුහුදේ ගිල්වා විනාශ කිරීම සඳහා වරායන්හි සිට මුහුදු සැතපුම් 12ක් (කි.මී 23 පමණ) සහ මීටර් 1000ක් ගැඹුරු මුහුද වෙත යාත්‍රා කල යුතු අතර, ඒ සඳහා වෙනම නෞකාවක්/ යාත්‍රාවක් යොමු කිරීම තුලින් විශාල පිරිවැයක් දැරීමට සිදුවීම.

ඇ. අධිකරණ කිහිපයක් සමඟ සම්බන්ධීකරණය වී නඩු භාණ්ඩ විනාශ කිරීමට පොදු දිනයක් නාවික හමුදාව වෙතින් ලබා දුන්නද විවිධ පරිපාලන හේතූන් නිසා අදාල අධිකරණ මගින් එම දිනයන් වෙනස් කර ගැනීම.

ඈ. මුහුදු ප්‍රවාහන පහසුකම් ලබාදීමේදී එම කටයුත්ත සඳහා පැමිණෙන පිරිස ගණනින් 05 දෙනෙකුට සීමා කරන ලෙස ඉල්ලා සිටියද ඊට වඩා වැඩි පිරිසක් පැමිණීම මගින් පරිපාලනමය ගැටළු පැන නැගීම.

ඉ. සමහර අධිකරණ මගින් භාණ්ඩ ස්වල්පයක් පමණක් ගිල්වීම සඳහා ලිපි ඉදිරිපත් කරන අතර, එසේ කුඩා භාණ්ඩ ප්‍රමාණයක් ගිල්වීම සඳහා නාවික යාත්‍රාවක් යෙදවීම සාපේක්ෂව වියදම ඉහළ යාමට සිදුවීම.

[redacted]



2. එබැවින්, ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන එම අපහසුතාවයන් මඟහරවා යෝජිත අවශ්‍යතාවය වෙනුවෙන් නාවික යාත්‍රා ආර්ථික ඵලදායිතාවයකින් යුතුව යෙදවීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් පහත සඳහන් පරිදි ක්‍රමවේදයන් යෝජනා කෙරේ.

අ. සෑම මාස තුනකට දෙවතාවක් පමණක් (සතියේ දින සහ සති අන්ත දින ඇතුලත් වන පරිදි) ගිනි අවි සහ ආයුධ මුහුදේ ගිල්වා විනාශ කිරීම සඳහා වසරේ විවිධ කාලසීමාවල ලංකාව අවට මුහුදේ ස්වභාවයද සැලකිල්ලට ගෙන යෝජිත කාල සීමාවන් වලට අනුව ඒ ඒ වරායන් මගින් නෞකා දියත් කිරීම. තවද, වෙනත් අත්‍යවශ්‍ය මෙහෙයුම් රාජකාරී කටයුත්තක් සඳහා නෞකා යෙදවීමට සිදුවීම නිසා හෝ මුහුදේ ස්වභාවය මත යෝජිත දිනයට නෞකා යාත්‍රා දියත් කිරීමට නොහැකි වුවහොත් එය දක්වා ඇති ආදේශක දිනයේදී සිදුකරන ලැබේ.

| යෝජිත කාල සීමාව | යෝජිත දින පරාසයන් | යෝජිත දිනයන් | ආදේශක දිනය | යෝජිත වරාය |
|---|---|---|---|---|
| වර්ෂයේ පළමු කාර්තුව සඳහා (ජනවාරි සිට මාර්තු දක්වා) | සතියේ දින සඳහා | ජනවාරි මස අවසන් සිකුරාදා | පෙබරවාරි මස අවසන් සිකුරාදා | කොළඹ සහ ගාල්ල |
| | සති අන්ත දින සඳහා | පෙබරවාරි මස පළමු සහ දෙවන සෙනසුරාදා | මාර්තු මස දෙවන සෙනසුරාදා | |
| වර්ෂයේ දෙවන කාර්තුව සඳහා (අප්‍රේල් සිට ජූනි මාසය දක්වා) | සතියේ දින සඳහා | අප්‍රේල් මස අවසන් සිකුරාදා | මැයි මස පළමු සිකුරාදා | ත්‍රිකුණාමලය ගාල්ල/ හම්බන්තොට |
| | සති අන්ත දින සඳහා | මැයි මස අවසන් සෙනසුරාදා | ජූනි මස අවසන් සෙනසුරාදා | |
| වර්ෂයේ තෙවන කාර්තුව සඳහා (ජූලි මස සිට සැප්තැම්බර් මස දක්වා) | සතියේ දින සඳහා | ජූලි මස අවසන් සිකුරාදා | අගෝස්තු මස පළමු සිකුරාදා | ත්‍රිකුණාමලය සහ කන්කසන්තුරය |
| | සති අන්ත දින සඳහා | අගෝස්තු මස අවසන් සෙනසුරාදා | සැප්තැම්බර් මස පළමු සෙනසුරාදා | |
| වර්ෂයේ සිව්වන කාර්තුව සඳහා (ඔක්තෝබර් මස සිට දෙසැම්බර් මස දක්වා) | සතියේ දින සඳහා | ඔක්තෝබර් මස අවසන් සිකුරාදා | නොවැම්බර් මස අවසන් සිකුරාදා | කොළඹ සහ ගාල්ල/ හම්බන්තොට |
| | සති අන්ත දින සඳහා | නොවැම්බර් මස අවසන් සෙනසුරාදා | දෙසැම්බර් මස පළමු සෙනසුරාදා | |

ආ. ඉහත දිනයන් අනුව ගරු අධිකරණ මගින් මාසයකට පෙර නාවික හමුදා මූලස්ථානය වෙත අදාල ඉල්ලීම ඉදිරිපත් කිරීම.

ඇ. නාවික හමුදා මූලස්ථානය වෙතින් ලැබී ඇති ඉල්ලීම් සලකා බලා ඉහත 'අ' හි සඳහන් පරිදි දක්වා ඇති දිනයන්හිදී පමණක් මුහුදේ ගිල්වා විනාශ කිරීම සඳහා සුදුසු නෞකාවක්/ යාත්‍රාවක් යෙදවීම.

ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையக கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. Website : www.defence.lk

මගේ අංකය / எனது இல / My No : එම්ඩී/එල්එල්/එන්ඩී/02 /02 ( )
ඔබේ අංකය / உமது இல / Your No :

තැ. පෙ. / த. பெட்டி / P.O. Box 572
දුරකථන / தொலைபேசி / Telephone 2430860-9, 2430870-8
ලේකම් / செயலாளர் / Secretary — දුර./தொ./Tel. : 011 2381154; ෆැක්ස්/தொ./Fax : 011 2541529; ඊ. තැපැල/மி.அ./Email : secdefence@defence.lk
දිනය / திகதி / Date : 2023 දෙසැම්බර් දින

C

ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

<u>ගිනි අවි සහ තහනම් අවි ආයුධ මුහුදේ ගිල්වා විනාශ කිරීම</u>

යොමුව: අංක JSC/SEC/MISC/2023 (II) හා 2023.11.16 දාතමින් යුතුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් මෙම අමාත්‍යාංශය වෙත යොමු කර ඇති ලිපිය.

1. යොමුගත ලිපිය මගින් අපේක්ෂිත විස්තර පහත සඳහන් පරිදි නිසි කටයුතු සඳහා ඉදිරිපත් කරන බැව් කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

අ. එක් ගමන් වාරයක් සඳහා එක් අධිකරණයකින් සහභාගී කරගත හැකි උපරිම නිලධාරීන් ගණන 05 දෙනෙකුට සීමා කර ඇති අතර, විශේෂ අවස්ථාවන් වලදී පමණක් ගරු විනිශ්චයකාරතුමන්ලාගේ ඉල්ලීම මත එක් අධිකරණයකින් සහභාගී කරගත හැකි උපරිම නිලධාරීන් ගණන 07 දෙනෙකුට සීමාවන පරිදි සංශෝධනය කල හැකි බැව් කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

ආ. ගිනි අවි හා තහනම් අවි ආයුධ මුහුදේ ගිල්වා විනාශ කිරීමට අදාල සම්බන්ධීකරණ කටයුතු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයට අනුයුක්තව නියෝජ්‍ය අධ්‍යක්ෂ නාවික මෙහෙයුම් වශයෙන් රාජකාරි කරනු ලබන කපිතාන් (සංඥා), ඩබ්එම්එම්එස්බී වාහල (දුරකථන අංක 0117192213/ 0773952052) යන ජ්‍යෙෂ්ඨ නිලධාරී නම් කර ඇත.

ඩී පී වෙලගෙදර ආර්එස්පී යූඑස්පී
මේජර් ජෙනරාල්
හමුදා සම්බන්ධතා නිලධාරී
ආරක්ෂක ලේකම් වෙනුවට

පිටපත:

නාවික හමුදාපති

අතිරේක ලේකම් (පරිපාලන) / Additional Secretary (Administration) — දුර./தொ./Tel. - 011 2326000; ෆැක්ස්/தொ./Fax. - 011 2446300
අතිරේක ලේකම් (සිවිල් ආරක්ෂක හා සංවර්ධන) / Additional Secretary (Civil Defence and Development) — දුර./தொ./Tel. - 011 2335792; ෆැක්ස්/தொ./Fax. - 011 2335797
අතිරේක ලේකම් (තාක්ෂණ) / Additional Secretary (Technical) — දුර./தொ./Tel. - 011 2333930; ෆැක්ස්/தொ./Fax. - 011 24179
අතිරේක ලේකම් (ආරක්ෂක) / Additional Secretary (Defence) — දුර./தொ./Tel. - 011 2389186; ෆැක්ස්/தொ./Fax. - 011 2441481
අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු, ප්‍රතිපත්ති හා සැලසුම්) / Additional Secretary (Parliament Affairs, Policy and Planning) — දුර./தொ./Tel. - 011 2369023; ෆැක්ස්/தொ./Fax. - 011 2369022
අතිරේක ලේකම් (පොලිස්) / Additional Secretary (Police) — දුර./தொ./Tel. - 011 2887182; ෆැක්ස්/தொ./Fax. - 011 28872
අධ්‍යක්ෂ ජනරාල් (ගිණුම් හා මුදල්) / Director General (Accounts & Finance) — දුර./தொ./Tel. - 011 2446300; ෆැක්ස්/தொ./Fax. - 011 2439381

ඇ. අධිකරණ මගින් නිලධාරීන් ඇතුළත් කාර්යය මණ්ඩලය ගණනින් 05 දෙනෙකුට පමණක් සීමා කිරීම.

3. කරුණු එසේ වුවද, ආරක්ෂිත හෝ නීතිමය කටයුතු හේතුකොට ගෙන හදිසි අවශ්‍යතාවයන් මත ගිනි අවි හෝ කහනාම් අවි ආයුධ මුහුදේ ගිල්වා විනාශ කිරීමට අවශ්‍ය වුවහොත් ඉහත යෝජිත ක්‍රමවේදයට අමතරව මුහුදු ප්‍රවාහන පහසුකම් සහ සුදුසු විරයක් නාවික හමුදා මූලස්ථානය මගින් දියත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව වැඩිදුරටත් දන්වමි.

4. කරුණු එසේ හෙයින්, ඉහත සඳහන් කරන ලද කරුණු පිළිබඳ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඒඩී වරසිංහ, ආර්එස්පී, පීඑස්සී
කොමදෝරු
අධ්‍යක්ෂ නාවික මෙහෙයුම්
නාවික හමුදාපති වෙනුවට

පිටපත්:
ආඥාපති නැගෙනහිර නාවික පෙදෙස
ආඥාපති උතුරු නාවික පෙදෙස
ආඥාපති බටහිර නාවික පෙදෙස
ආඥාපති දකුණු නාවික පෙදෙස